මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත

(AETI - Japan Tec)


# ආධුනිකයින් බඳවා ගැනීම -2026 වසර


අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශය

වෘත්තීය අධ්‍යාපන අංශය

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය


**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ජපන් රජය මගින් ප්‍රධානය වූ මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණකාලීන පාඨමාලා සඳහා 2026 වර්ෂයට ආධුනිකයන් බඳවා ගැනීම පිණිස වයස 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**



| | පූර්ණ කාලීන පාඨමාලා | කාලය | පාඨමාලා ගාස්තු (දිවා)* | බඳවා ගැනීමේ සුදුසුකම් |
|---|---|---|---|---|
| 1.1 | මෝටර් රථ තාක්ෂණ ශිල්පී Automobile Technician | අවු 03 | රු.200,000/- | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. 2026/01/01 දිනට වයස වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයටම අයදුම් කළ හැක. |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී Automobile Electrician | අවු 03 | රු.200,000/- | |
| 1.3 | යන්ත්‍ර ශිල්පී Machinist / CNC | අවු 03 | රු.170,000/- | |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ තාක්ෂණ ශිල්පී Automobile A/C Technician | අවු 02 | රු.70,000/- | |
| 1.5 | මෝටර් රථ ටින්කර් ශිල්පී Automobile Tinker | අවු 1½ | රු.30,000/- | රජයේ හෝ රජය විසින් පිළිගන්නා ලද පාසලක 8වන ශ්‍රේණිය සමත්ව තිබීම. 2026/01/01 දිනට වයස වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයටම අයදුම් කළ හැක. |
| 1.6 | මෝටර් රථ පින්තාරු ශිල්පී Automobile Painter | අවු 1½ | රු.30,000/- | |

**දිවා පූර්ණකාලීන පාඨමාලා සඳහා ආධුනිකයන් බඳවා ගැනිමෙන් පසු ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය මත අයදුම්කරුවන් අතරින් සීමිත සිසුන් පිරිසක් සඳහා සන්ධ්‍යා කාලීන පාඨමාලා ආරම්භ කෙරෙන අතර. ඒ සඳහා 50% ක අමතර පාඨමාලා ගාස්තුවක් අය කෙරේ.**

## සහතිකපත් ප්‍රදානය

සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකය සමග තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිරිනමන ජාත්‍යන්තරව පිළිගත් "ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකයද (NVQ Level 4) ප්‍රදානය කරනු ලැබේ.

## අයදුම්පත් එවිය යුතු ආකාරය

2025 අගෝස්තු මස 08 වන දින ගැසට් පත්‍රයේ (සිංහල) සඳහන් ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පතෙහි පසු පිටෙහි මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක 071100103320674 දරණ ගිණුමට විභාග ගාස්තු ලෙස රු.1000.00 ක් බැර කර ලබාගත් ලදු පත ඇලවිය යුතුය.(මාර්ගගත ක්‍රමයට හෝ CDM ක්‍රමයට කරන ලද ගෙවීම් වලංගු නොවන අතර ලදුපතෙහි තැන්පත්කරුගේ නම සහ හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය). අප ආයතනයට පැමිණද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැක. නැතහොත් www.naita.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

සම්පූර්ණ කරන ලද අයදුම්පත ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් සමග **2025 සැප්තැම්බර් මස 10 දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, නො. 69/A, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ **"ආධුනිකයින් බඳවා ගැනීම - 2026"** යනුවෙන් සඳහන් කළ යුතුය.

වැඩිදුර විස්තර සඳහා ලේඛකාධිකාරී දුරකථන අංක

**011-2572977 හෝ 011-2531844 විමසන්න**

නැතහොත් 2025 අගෝස්තු මස 08 වන දින ගැසට් නිවේදනය බලන්න


සභාපති

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

නො. 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.

011 288 782 - 5 naita sri lanka www.naita.gov.lk